**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය - 2021**

**------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 48 ඡේදය අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත මඟින් අවසර දී ඇති විටෙක හැර ආදායමට වියදම් හිලව් නොකල යුතු වුවත් ආදායම් අයිතම 05 කට අදාලව එකතුව රු. 53,382,820 ක් වූ ආදායමෙන් එකතුව රු. 23,917,086 ක වියදම් හිලව් කර ශුද්ධ ආදායම රු. 29,465,734 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම ආදායම් හා වියදම් වෙන වෙනම දැක්වීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 14 වගන්තිය හා 7 හි 47 ඡේදය අනුව අධිකාරියට අයත් ඉඩම් 29 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | මේ වන විට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සතු ඉඩම් කැබලි 28ක් තක්සේරු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය තොරතුරු සහිතව තක්සේරු දෙපාර්තමේන්තුවට ලබා දී ඇත. ඒම වාර්තා ලද විගස ගිණුම් වල ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතමවල සාධාරණ වටිනාකම සෑම වර්ෂ 03 කට හෝ 05 කට වරක් ප්‍රත්‍යාගණනය කලයුතු වුවත් අධිකාරිය සතු ඉඩම් හා ගොඩනැගිලි 2008 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | මේ වන විට ඉඩම් ගොඩනැගිලි තක්සේරු දෙපාර්තමේන්තුව තක්සේරු කරමින් පවතින අතර එම කටයුතු අවසන් වූ පසු ගිණුම් වල ගැලපීම් සිදු කරනු ඇත. රන් කාසි සම්බන්ධයෙන් 2020 වර්ෂයේ තක්සේරු කිරීම් සිදුකර ඇති අතර 2022 වර්ෂයේදී එම රන් කාසි නිවැරදිව තක්සේරු කර 2022 වර්ෂයේ ගැලපීම් සිදුකරනු ලැබේ. | යොමුගත ප්‍රමිතිය පරිදි ජංගම නොවන වත්කම් වර්ෂ 03 කට හෝ 05 කට වරක් ප්‍රත්‍යාගණනය කල යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු. 240,467,473 ක භාණ්ඩාගාර හා අනෙකුත් රාජ්‍ය ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීම හා මැනීම සිදුකර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රමිත 11හි සංශෝධනයන්ට අනුව 2022 වර්ෂයේදි නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 12 අනුව සින්නක්කර ඉඩම් හා බදු ඉඩම්, මූල්‍ය ප්‍රකාශනවල වෙන්කර දක්වා නොතිබුණු අතර එකතුව රු. 9,842,565 ක් වූ කල්බදු ඉඩම් 05 ක් සම්බන්ධයෙන් යොමුගත ප්‍රමිතය පරිදි ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. | විමසුමේ සඳහන් පරිදි අධිකාරිය විසින් කල්බදු ක්‍රමයට ඉඩම් ලබාගැනීමේදී යටියන්තොට ඉඩමට අදාලව පමණක් රු.9000ක බදු කුලියක් ගෙවන අතර අනෙකුත් ඉඩම් 04 සඳහා බදු කුලියක් ගෙවනු නොලබයි. ඒ අනුව ප්‍රමිත අංක 12 යටතේ ක්‍රමක්ෂය කිරීම 2022 වර්ෂයේදී ගිණුම් පිළියෙළ කිරීමේදී සිදුකරනු ලබයි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සම්පූර්ණ (100%) කොටස් අයිතිය සහිතව 2013 | මෙම ආදායම් සහ වියදම් වලට අදාල ලෙජර් ගිණුම් වෙන වෙනම පවත්වා ගෙන යන අතර | 2007 අංක 07 දරන සමාගම් පනතේ 51(4)(a) කොටසේ කොටස් නිකුතු සහතිකය |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 18 දින වී.ටී.ඒ. හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලියාපදිංචි කර තිබුණි. එහෙත් 2013 දෙසැම්බර් 18 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වාම අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අධිකාරිය විසින් ඉදිරිපත් කර නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති ආකාරයට අවසන් ගිණුම් ප්‍රකාශණවල මෙහෙයුම් ප්‍රකාශනයෙහි සහ ඊට අදාල සටහන් වල වෙන් වෙන් වශයෙන් සටහන් කිරීමට 2022 වර්ෂයේ කටයුතු කරනු ඇත. | අනුව රු. 10 ක කොටස් වෘත්තීය පුහුණු අධිකාරිය වෙත නිකුත් කර තිබුණු බැවින් අදාළ සමාගමේ මූල්‍ය ප්‍රකාශන කඩිනමින් විගණනය වෙත ඉදිරිපත් කළයුතුය. |
| (ආ) | 2018 වර්ෂයේදී මිලදීගත් වත්කම් පංති 03 කට අදාලව එකතුව රු. 25,775,505 ක් වූ වත්කම් සඳහා ක්ෂය ද්විගණනය වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය රු. 2,943,759 ක් හා 2019 හා 2020 වර්ෂයන්ට අදාල ක්ෂය රු. 9,221,628 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. ඒ හේතුවෙන් වර්ෂයේ ඌනතාවය රු. 2,943,759 කින් හා සමුච්චිත අරමුදලේ හර ශේෂය රු. 9,221,628 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මේ සඳහා අදාල ගැලපීම් 2022 අවසන් ගිණුම් පිළියෙළ කිරීමේදී සිදු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදිව ක්ෂය ගණනය කිරීම් කල යුතුය. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණිත අගය රු. 198,889,054 ක් වූ වත්කම් රජයේ ප්‍රාග්ධන ප්‍රදාන යටතේ මිලදීගෙන සම්පූර්ණයෙන් ක්ෂය කර හා විලම්භීත ආදායම් ලෙස කපාහැර අවසන් වී තිබියදී එම වත්කම් ප්‍රත්‍යාගණිත වටිනාකම මත ක්ෂය කිරීමේදී ඊට සමාන ප්‍රමාණයක් තවදුරටත් විලම්භීත ආදායම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයට අදාල අලාභය රු. 18,780,149 කින් හා සමුච්චිත අරමුදලේ හර ශේෂය රු. 76,820,627 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 13 අනුව වත්කම් නැවත අගය කිරීමේදී පදනම් 02ක් සළකා බලයි.එනම් වෙළඳපල පිරිවැය සහ මිල පිරිවැයයි. ඒ අනුව අදාළ වත්කම් මිල දී ගත් වර්ෂය හෝ පිරිවැය නොදන්නේ නම් ඉහත වෙළඳපල පිරිවැය අනුගමනය කරනු ලබයි. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 1996 වර්ෂයේ සිට වත්කම් සහ කම්කරු දෙපාර්තුමේන්තුවෙන් පවරා ගත් වත්කම් තිබෙන බැවින් එහිදී මිලදී ගත් කාල සීමාව සඳහන් කිරීම අපහසුය. ඒ අනුව ඉහත තත්වය අනුගමනය කර ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදිව ගණනය කිරීම් සිදුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුල ඉවත්කරන ලද වත්කම් වලට අදාල පිරිවැය හා සමුච්චිත ක්ෂය අදාල ගිණුම්වලින් ඉවත් කර වත්කම් ඉවත්කිරීමෙන් ලද ලාභය හඳුනාගෙන ගිණුම්ගත කිරීම වෙනුවට වත්කම් විකිණීමෙන් ලැබී තිබුණු රු: 2,030,410 ක මුදල වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ සිට නිවැරදිව වත්කම් හඳුනාගෙන වෙන්දේසි කිරීමට කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ඉ) | 2018 දෙසැම්බර් 31 දිනට ශුද්ධ අගය රු.4,496,902 ක් වූ මෝටර් රථ 24 ක්, එම වර්ෂයේදී සිදුකර තිබුණු ප්‍රත්‍යාගණනයේදී අත්හැරී තිබුණද එය නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී ද තටයුතු කර නොතිබුණි. | මෙම මොටර් රථ 24 පුහුණු උපකරණ ලෙස යොදාගෙන ඇත. අදාල මෝටර් රථවල ලියාපදිංචිය අවලංගු කිරීමට අමාත්‍යාංශ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත දැනුම් දී ඇති අතර ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | මෝටර් වාහන පංතිය යටතේ ගිණුම්ගත කර තිබුණු මෝටර් රථ 24 දැනට භාවිතා කරන අංශය හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ | | | |
| | i. මුදල් රෙගුලාසි 04 වන උපලේඛනයේ 288 පොදු ආකෘතිය | අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට ශුද්ධ අගය රු.7,971,202,923 ක් වූ දේපල පිරියත උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | අධිකාරිය විසින් මේ වන විට Busy මෘදුකාංගය හරහා ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යාමට අදාල කටයුතු සිදු කරමින් පවතින අතර ඒ අනුව ඉදිරියේදී මෙම ගැටළුව මඟහැරෙනු ඇත. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතුය. |
| | ii.මුදල් රෙගුලාසි 1646 | ධාවනය කරනු ලබන සංචිත වාහනවල ධාවන සටහන් ඊළඟ මාසයේ 15 වන දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවද සංචිත වාහන 123 කට අදාලව 2019 ජනවාරි | 2020,2021 වර්ෂ වලට අදාල ධාවන සටහන්වලින් කොටසක් 2022.03.29 දින වන විට විගණනයට ඉදිරිපත් කර ඇති අතර ඉතිරි සියල්ල ඉදිරියේදී ලබාදීමට | යොමුගත රෙගුලාසි ප්‍රකාරව නියමිත දිනට පෙර ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කිරීමට |

| | | | | |
|---|---|---|---|---|
| | | මාසයේ සිට 2021 දෙසැම්බර් දක්වා කාලපරිච්චේදය වෙනුවෙන් දෛනික ධාවන සටහන් 2022 මාර්තු 31 දින දක්වාම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එම සියළු වාහනවල ඉන්ධන සඳහා අදාල කාලපරිච්ඡේදය වෙනුවෙන් රු. 28,280,105 ක් වැය කර තිබුණි. | කටයුතු කරමි. | කටයුතු කල යුතුය. |
| (ආ) | 2017 ඔක්තෝබර් 25 දිනැති අංක 05/ 2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතියෙන් මූලික වැටුපෙන් 1/3 දීමනා ලබාගන්නා නිලධාරීන් 08 දෙනෙක් වෙනුවෙන් චක්‍රලේඛයට පටහැනි ලෙස 2017 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා රු. 1,669,516 ක් ගෙවීම් කර තිබුණි. | ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතියේ 1/3 දීමනාව ලබා ගත් නිලධාරීන් 08 දෙනාගෙන් අයවිය යුතු මුදල 2022 ජූනි මස සිට වාරික 08 කින් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සිදුකල ගෙවීම් අයකර ගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 03/2003 හා 05/2013 දරන අභ්‍යන්තර චක්‍රලේඛය | අධිකාරියේ එක් එක් නිලධාරියෙකු එක් දිස්ත්‍රික්කයක රාජකාරී කලයුතු උපරිම සේවා කාලය වසර 06 ක් පමණක් වුවත් ඒ අනුව වසර 06 කට වඩා සේවා කාලයක් සහිත නිලධාරීන් සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම අධිකාරියේ ස්ථානමාරු පටිපාටියේ අනිවාර්යයෙන් සේවකයෙකු නිශ්චිත සේවා කාලය සම්පූර්ණ වීමෙන් පසු අනිවාර්ය ස්ථානමාරුවීම් සිදු කිරීමක් නොමැති බැවින් එය සංශෝධනය කිරීම සඳහා දැනට ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. අදාළ සංශෝධනයන් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යෝජනා ඉදිරිපත් කර ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | අභ්‍යන්තර චක්‍රලේඛ විධිවිධාන අනුව ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කල යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,050,040,402 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.989,421,893 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 60,618,509 ක

පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රජයේ පුනරාවර්තන ප්‍රදාන අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 වර්ෂයේ සිට 2015 මැයි මාසය දක්වා සේවක භාරකාර අරමුදල් දායකය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් 2019 වර්ෂයේදී ගෙවීමට සිදු වී තිබුණු රු. 7,898,073 ක අධිභාර මුදල් එයට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | එම තත්වය නොසැලකිල්ලෙන් සිදුවූවක් නොවන අතර මෙම දීමනාව අන්තර් දීමනාවක් ලෙස වැරදි ලෙස අර්ථ නිරූපණය කර ගැනීමෙන් මෙම තත්වය උද්ගත වී ඇත. අධ්‍යක්ෂක මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන මෙම ගෙවීම සිදු කර ඇත. | නොසැලකිලිමත් ලෙස කටයුතු කිරීම හේතුවෙන් අධිභාර ගෙවීමට සිදුවී තිබුණි. එම නිසා අදාල වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඔවුන්ගෙන් එම මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය හා ගම්පහ කාර්මික විද්‍යාලය ඉදිකිරීමේ කොරියානු ණය ව්‍යාපෘතියෙන් 2019 වර්ෂයේදී අධිකාරිය යටතේ පවතින ඔරුගොඩවත්ත කොරියන් ටෙක් ආයතනය වෙත ලබාදී තිබුණු එකතුව රු. 15,743,838 ක උපකරණ 157 ක් කිසිදු ප්‍රයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතුණු අතර එකතුව රු. 1,784,794 ක් වටිනා උපකරණ 07 ක් අක්‍රීය වී පැවතුණි. එසේම එම ආයතනයට වෛද්‍ය හෝ හෙද තනතුරු අනුමත වී නොතිබියදී රු. 3,500,000 ක වටිනාකමැති වෛද්‍යවරුන් විසින් භාවිතයට ගනු ලබන වෛද්‍ය උපකරණ හා ඖෂධ ලබාදී තිබු අතර එම ඖෂධ වර්ග භාවිතයකින් තොරව කල් ඉකුත් වි තිබුණි. | අදාළ උපකරණ ඒ ඒ ස්ථාන වල විධිමත් පරිදි ස්ථානගත කිරීමට කටයුතු කර ඇත.අක්‍රීයව පැවති උපකරණ 07 මෙ වන විට ශ්‍රී ලංකාවේ නියෝජිත ආයතනයක් වෙත දන්වා අලුත්වැඩියා කර ඇති අතර බෙහෙත් වර්ග වෛද්‍ය නිර්දේශ නොමැතිව භාවිතයට ගත නොහැකි අතර තුවාල වීම්, තැලීම් සඳහා භාවිතයට ගත හැකි ද්‍රව්‍ය පමණක් භාවිතයට ගැනීමට කටයුතු කර ඇත. | අධිකාරියේ අවශ්‍යතාවය හා ප්‍රමුඛතා අනුපිළිවෙල මත වත්කම් අත්පත් කර ගැනීම හා මිලදී ගැනීම සිදුකල යුතුය. විදේශීය ණය අරමුදල් මත සපයා ඇති උපකරණ බොහොමයක් නිෂ්කාර්යව පැවති අතර එම උපකරණ කඩිනමින් ප්‍රයෝජනයට ගැනීමට පියවර ගත යුතුය. |

**3.3** **ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කළුතර දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ 2021 වර්ෂය තුල අවස්ථා 173 කදී වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය යටතේ සිදුකර තිබුණු එකතුව රු. 11,776,318 ක්වූ මිලදීගැනීම්වලට අදාලව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනි ලෙස සැපයුම්කරුවන් ලියාපදිංචි නොකිරීම, ලංසු විවෘත කිරීමේ කමිටු පත් නොකිරීම, මුද්‍රා නොතැබූ ලංසු භාරගැනීම, සාවද්‍ය මිලගණන් බිල්පත් සඳහා ගෙවීම් කිරීම ආදී විශාල ප්‍රමාණයේ බැහැර වීම් නිරීක්ෂණය විය. | හදිසි අත්‍යාවශ්‍ය කටයුතුවලදී ලැබී තිබූ මිලගණන් අනුව මිලදීගැනීම් කටයුතු සිදුකරන ලදී. ඉදිරියේදී වැරදි අඩුපාඩු සකස් කර ගැනීමට උපදෙස් ලබාදී ඇත. | සෑම මිලදීගැනීමක් සඳහාම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර ගුණාත්මක භාණ්ඩ හා සේවා අවම පිරිවැයක් යටතේ මිලදීගෙන ආර්ථික වාසි සලසා ගත යුතුය. |